රසායන වාජීකරණය

වෛද්‍ය
ගාමිණී විජේසිංහ
රජයේ ආයුර්වේද මහ රෝහලේ
හිටපු ප්‍රධාන වෛද්‍ය නිළධාරී
ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී
ඛාහිර කථිකාචාර්ය -
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍යාතනය,
කැළණිය විශ්ව විද්‍යාලය

රස යනු ආහාර රසයි. අයන යනු ආහාර රස ගෙනයන මාර්ගයයි. මේවා ස්‍රොකස් නමින් ද හඳුන්වනු ලැබේ.

මනා පවුල් සැලසුමක් අනුව නීරෝගී දරුවන් ලබා, යහපත් ගෘහ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය උපක්‍රම වාජීකරණ උපක්‍රම ලෙස හඳුන්වනු ලැබේ.

අප ගන්නා ආහාරය මැනවින් දරුවා පෝෂණ කාර්ය සඳහා සොතස් හෙවත් නාල මාර්ග හරහා ශරීරය පුරා ගෙන යමින් ශරීරයේ පැවැත්ම ඇති කරයි. උපන්දා සිට මරණය තෙක්, අඛණ්ඩ මෙම කාර්ය සිදුකෙරේ. නමුත් යම් යම් වැරදි ආකාර විහරණ හේතු හෝ මානසික දෝෂ නිසා මෙම ක්‍රියාවලිය බිඳවැටීමේ හේතුවෙන් රෝග ඇතිවිය හැකිය.

නීරෝගී අයගේ නීරෝගී කම ආරක්ෂා කිරීමත් වැළඳුන රෝග සඳහා ප්‍රතිකාර කිරීමත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ පරමාර්ථයයි. නීරෝගී කම ආරක්ෂා කර ගනිමින් දීර්ඝායුෂ ලබා ගැනීම සඳහා රසායන ප්‍රතිකාර වැදගත්වනු ඇත. එම රසායන ප්‍රතිකාර විවිධ පුද්ගල ..... අනුව හා වැළඳුන රෝග සුව කිරීමෙන් පසුව එවැනි අයට ද ඒ ඒ ව්‍යුහා ගත රෝග වලට අනුව යොදනු ලැබේ.

නීරෝගී අය වෙනුවෙන් රසායන ප්‍රතිචාර යෙදීමේදී, ශරීරය ස්නේහන - ස්වේදන නම් උපක්‍රම යොදා ඉන් අනතුරුව ශරීරය ශෝධන උපක්‍රම ද (නාසය, වමන, විරේක, වස්ති) යොදා අනතුරුව රසායන වාජීකරණ උපක්‍රම යොදනු ලැබේ.

මෙහිදී ස්නේහන - ස්වේදන උපක්‍රම නිසා ශරීරයේ ස්‍රොකෝමාර්ග විවෘත වී ඒ තුළ පවත්නා මල කොටස් ද්‍රව බවට පත් වී ඉබේ පිටවන්ට පටන් ගනී. ඒකාකී සැකෙවින් ඉටු කර ගැනීම සඳහා නාසය, වචන විරේක, වස්ති යන උපක්‍රම යොදනු ලැබේ. ඉන් පසුව ක්‍රමානුකූලව රාසායන - වාජීකරණ ප්‍රතිකාර යෙදීමෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල ලබා ගත හැකිවන්නේය.

ආචාර රසායනය

ඖෂධ වලින් තොරව රාසායන ගුණ ලබා ගත හැකිය, ශ්‍රේෂ්ඨතම රාසායනය ද එයමය. සතුන් නොමරණ, සොරකම් නොකරණ හිස්බස් නොදොඩන, කේළාම් නොකියන අධික වශයෙන් මත්පැන් නොබොන පරදාර සේවනය නොකරණ ප්‍රියවචන කථාකරන ගෙදරට පැමිණෙන අයට සුදුසු විධියෙන් සංග්‍රහ කිරීම, දානමය පුණ්‍ය ක්‍රියාවනි යෙදෙන දෛනික කටයුතු වලදී සත්භාවයෙන් කටයුතු කරන කෙටියෙන් කිවහොත් දස පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙන පුද්ගලයා ආචාර රසායනය වළඳන්නේ වෙයි. මොවුනට රෝග නොවැළඳෙන්නෝය. දීර්ඝායුෂ ලැබෙන්නේය.

මනා රූප සම්පත්තියෙන් යුත් පවිත්‍ර යූ රති ක්‍රියාවෙහි දක්ෂ වූ පර පුරුෂයන් ගැන නොසිතන ඉහත කී ආචාර රසායන වළඳන ස්ත්‍රිය හොඳම වාජීකරණය දා වන්නේය.

බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන චරිත කෝසල මල්ලිකා, විශාඛා වැනි අය හත්වැනි වයසේ දී, සෝවාන් ඵලයට පත්ව මනා ගෘහ ජීවිතයක් ගත කරමින් බොහෝ දරු මුණුබුරන් ලැබ ජීවත් වූ අය බව ප්‍රකටය. දැනුදු එවැනි අය නැත්තේ නොවේ. දැහැමි ජීවිතය සියලු සැප සම්පත් ලැබෙන මාර්ගයයි.

අප ඉතා හොඳ ආහාරයක් නියමිත වේලාවට, නියමිත මාත්‍රාවෙන් ගත්තේ වී නමුදු තරහෙන් සිටිය හොත්, ශෝකයෙන් සිටිය හොත් එම ආහාරය නොදිරවන්නේය. එනිසා රෝග වැළඳෙන්නේය. රසායනය, වාජීකරණය නොවන්නේය.

(මීට අනතුරුව, ආහාර නොදිරවීම රෝග හේතුවක් වන බව)

ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න

වෛද්‍යාචාර්ය, ගාමිණී විජේසිංහ